## 211 සමිඳේ ඔබේ කූඩාරමේ

සමිඳේ ඔබේ කූඩාරමේ සැරිසරන්නෝ කවුරුදෝ
ඔබේ පිවිතුරු කඳුකරේ පා තබන්නෝ කවුරුදෝ

හිතේ කිළුටක් නැතිවැ හැසිරෙන්නෝ
යුක්ති සහගත දෙයට හිත දෙන්නෝ
නොවක් හිතෙකින් ඇත්ත පවසන්නෝ
අනුන් අවමන් දිවෙන් නොකියන්නෝ

සොහොයුරන් හට නපුර නොපතන්නෝ
අනුන් හොඳ නම කිලිටි නොකරන්නෝ
සියලු දුසිරිත් කෙරෙන් දුරුවන්නෝ
සුසිරිතට නිරතුරුවැ හිත දෙන්නෝ

මුදල් දී ගිනි පොලී නොකරන්නෝ
අල්ලසක් ගෙන අනුන් නොපෙළන්නෝ
අහිංසකයන් පෙළා නොතළන්නෝ
නිදොස් අය පිටැ වරද නොතබන්නෝ

කුරිරුවන් අත දුරින් දුරලන්නෝ
සමිඳු ජන බුහුමනින් සලකන්නෝ
සමිඳු බාරය පැහැර නොහරින්නෝ
මෙබඳු අය මැයි වාසනා ලද්දෝ